# ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## පළමු වාර පරීක්ෂණය - 2019

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

කාලය පැය 01

11 ශ්‍රේණිය

නම / විභාග අංකය : ........................................................................................................

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. මානවයාගේ මුල්ම සන්නිවේදන ස්වරූපය වන්නේ,
(1) ශ්‍රව්‍ය සන්නිවේදනය (2) වාචික සන්නිවේදනය
(3) අවාචික සන්නිවේදනය (4) ලිඛිත සන්නිවේදනය

02. සන්නිවේදන බාධක අවම කරගත හැකි සන්නිවේදන වර්ගය වන්නේ,
(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
(2) අන්තර් පුද්ගල සන්නිවේදනය
(3) ලිඛිත සන්නිවේදනය
(4) අවාචික සන්නිවේදනය

03. කෙනෙකුගේ පංචේන්ද්‍රිය මඟින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම හඳුන්වන්නේ,
(1) ප්‍රතිපෝෂණය (2) ආකේතීකරණය
(3) විකේතීකරණය (4) සංජානනය

04. භාෂාවක මූලික කාර්යයක් නොවන්නේ,
(1) වාචික ප්‍රකාශනය (2) කාලය සන්නිවේදනය කිරීම
(3) දැනුම සංරක්ෂණය (4) අංග චලනය

05. සන්නිවේදනයේදී ග්‍රාහකස්ථානය,
(1) තනි පුද්ගලයෙකි (2) කණ්ඩායමකි
(3) ආයතනයකි (4) තනි පුද්ගලයෙක්, කණ්ඩායමක් හෝ ආයතනයකි

06. අල්ටමීරා ගුහා චිත්‍ර අයත් වන සන්නිවේදන ස්වරූපය,
(1) ශ්‍රව්‍ය (2) ශ්‍රව්‍ය දෘශ්‍ය
(3) දෘශ්‍ය (4) ලිඛිත

07. පහත දක්වා ඇත්තේ ලැස්වේල්ගේ සන්නිවේදන ආකෘතියයි. මෙහි A, B, C, D පිළිවෙලින්,

A → B → C → ග්‍රාහකයා → D

(1) සන්නිවේදකයා, මාධ්‍ය, පණිවිඩය, බලපෑම
(2) සන්නිවේදකයා, පණිවිඩය, මාධ්‍ය, බලපෑම
(3) සන්නිවේදකයා, බලපෑම, පණිවිඩය, මාධ්‍ය
(4) සන්නිවේදකයා, මාධ්‍ය, බලපෑම, පණිවිඩය

08. දුරස්ථව අන්තර්පුද්ගල සන්නිවේදනයේ යෙදිය හැකි මෙවලමක් නොවන්නේ,

(1) දුරකථන (2) තැපැල් ලිපි

(3) ෆැක්ස් පණිවිඩ (4) ගුවන් විදුලිය

09. සන්නිවේදන මූලිකාංගයක් නොවන්නේ,

(1) සන්නිවේදකයා (2) මාධ්‍ය

(3) පෙලඹවීම (4) ග්‍රාහකයා

10. ග්‍රාහකයාගේ සංජානනයට බාධා පැමිනෙන හේතුවක් වන්නේ,

(1) සංදේශය තුල විවිධාර්ථ තිබීම.

(2) නිවැරදි ලෙස තොරතුරු ගොනුකර තිබීම.

(3) ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට ගැළපීම.

(4) සත්‍ය තොරතුරු සංදේශය තුල තිබීම.

11. සන්නිවේදන ක්‍රියාවලිය අංග සම්පූර්ණ වන්නේ,

(1) සංදේශය ග්‍රාහකයා වෙත ළඟා වීමෙනි.

(2) බාධක අවම වීමෙනි.

(3) දොරටුපාල සංකල්පය ක්‍රියාත්මක වීමෙනි.

(4) ග්‍රාහකයාගේ ප්‍රතිපෝෂණය ලැබීමෙනි.

12. සන්නිවේදනයේ මූලික අරමුණු 3 කි.

(1) අධ්‍යාපනය ලබාදීම, තොරතුරු සැපයීම, පෙළඹවීම.

(2) විනෝදාස්වාදය ලබාදීම, සන්නිවේදන බාධක, පෙළඹවීම.

(3) සමාජානුයෝජනය, ප්‍රතිපෝෂණය, තොරතුරු සැපයීම.

(4) සන්නිවේදන බාධක, ප්‍රතිපෝෂණය, පෙළඹවීම.

13. සංදේශයක් ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස ග්‍රාහකයා තුල ඇතිවන වෙනස,

(1) බලපෑම (2) සම්ප්‍රේෂණය

(3) ඝෝෂා (4) ප්‍රතිපෝෂණය

14. කිසියම් කෙනෙක්, යම් කිසිවක්, කිසියම් නාලියකින්, යම් කෙනෙකුට, යම් බලපෑමක් සඳහා ඉදිරිපත් කරන දෙය සන්නිවේදනයයි. මෙම අර්ථකථනය ඉදිරිපත් කරන ලද්දේ,

(1) ෂැනොන් හා වීවර් (2) හැරල්ඩ් ඩී. ලැස්වේල්

(3) කාල් මාක්ස් (4) ගුග්ලි යෙල්මෝ මාකෝනි

15. ලෝකයේ පළමු මුද්‍රණ යන්ත්‍රය නිර්මාණය කරන ලද්දේ,

(1) ට්සායි ලූන්

(2) ජොහැන්ස් ගුටෙන්බර්ග්

(3) සැමුවෙල් එෆ්.බී.මෝර්ස්

(4) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම් බෙල්

16. ආදරය, දයාව, කරුණාව, අනුකම්පාව ආදී හැඟීම් හුවමාරු කරගත හැක්කේ,

(1) විධිමත් සන්නිවේදනය මඟිනි (2) අවිධිමත් සන්නිවේදනය මඟිනි

(3) ද්වි පුද්ගල සන්නිවේදනය මඟිනි (4) ජන සන්නිවේදනය මඟිනි

17. නූතන විද්‍යුත් මාධ්‍ය වැඩි ඉඩකඩක් වෙන්කරනු ලබන්නේ,

(1) අධ්‍යාපනය (2) සමාජානුයෝජනය

(3) විනෝදාස්වාදය (4) ක්‍රීඩාව

18. සමූහ සන්නිවේදනයේදී සමූහයේ අවධානය දිනාගත හැකි ක්‍රමයකි,

(1) පෙළඹවීම (2) සම්ප්‍රේෂණය

(3) ප්‍රදීපාගාර උපක්‍රමය (4) දොරටුපාල සංකල්පය

19. සන්නිවේදනය වර්ගීකරණය අදාල වන්නේ,

(1) සහභාගි වන පුද්ගලයන් සංඛ්‍යාව (2) යොදාගන්නා උපකරණ

(3) භාවිතාකරන සන්දේශ (4) සන්නිවේදකයාගේ ස්වභාවය

20. සාම්ප්‍රදායික දෘශ්‍ය ය වන්නේ,

(1) අත් පත්‍රිකා, පෝස්ටර්, ධාරා සටහන්

(2) බිත්ති සටහන්, දුම, ගින්දර

(3) චිත්‍ර, පෝස්ටර්, ගින්දර

(4) ගින්දර, චිත්‍ර, දුම

21. (A) → (B) → (C) → (D) මෙම සන්නිවේදන ආකෘතිය,

(1) තනි දාමය (2) ඕපාදූප දාමය

(3) සම්භාවිතා දාමය (4) පර්ෂද දාමය

22. විධිමත් සන්නිවේදනයේදී භාවිතා නොවේ,

(1) රැස්වීම් (2) කටකතා

(3) යෝජනා පෙට්ටි (4) සාකච්ඡා

23. ඵලදායි ලේඛනයක ලක්ෂණයක් නොවන්නේ,

(1) නිරවුල් බව හා පැහැදිලි බව

(2) උචිත ආකෘතිය හා නිර්මාණශීලී බව

(3) සම්මත ව්‍යාකරණ විධි භාවිතය

(4) ඡේද වෙන් නොකිරීම

24. සමාජයීය අවකාශයේදී පුද්ගලයන් දෙදෙනෙකු අතර දුර,

(1) සෙ.මී. 15 - 20 (2) සෙ.මී. 30 - 60

(3) සෙ.මී. 1.2 - 1.8 (4) මීටර් 3.6 - 4.8

25. වාචික සන්නිවේදන නිපුණතා සංවර්ධනයට ගත යුතු ක්‍රියා මාර්ග,

(1) පෙර සූදානම (2) කථන රටා පුහුණු වීම

(3) සවන් දීමට පුහුණු වීම (4) ඉහත සියල්ලම

26. දෙමාපියන්, දූ දරුවන්, සහෝදරයන් සිටින්නේ,

(1) සමාජයීය අවකාශය (2) සහෘද අවකාශය

(3) පෞද්ගලික අවකාශය (4) පොදු අවකාශය

27. ලෝකයේ මුල්ම කඩදාසිය නිර්මාණය කිරීමේ ගෞරවය හිමි කර ගත්තේ,

(1) ට්සායි ලූන් (2) ගුටෙන්බර්ග්

(3) තෝමස් අල්වා එඩිසන් (4) පියරේ කියුරි

28. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතියේ ''යම් කිසිවක්'' යනුවෙන් අදහස් කෙරෙන්නේ,

(1) මාධ්‍ය (2) ග්‍රාහකයා

(3) සන්දේශය (4) සන්නිවේදකයා

29. ''අභිසාරීතාව'' යනුවෙන් අදහස් වන්නේ,

(1) එකට හමුවීම (2) එකට කතා කිරීම

(3) එකට ආහාර ගැනීම (4) එකට විසිර යෑම

30. අවාචික සන්නිවේදනයට අයත් නොවන සාධකය වන්නේ,

(1) සමාජයීය සාධක (2) ශාරීරික සාධක

(3) පාරිසරික සාධක (4) මාධ්‍ය සාධක

31. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය ආරම්භ කරන ලද්දේ,

(1) ලන්දේසි විසිනි (2) ඉංග්‍රීසීන් විසිනි

(3) පෘතුගීසීන් විසිනි (4) චීන ජාතිකයිනි විසිනි

32. පන්ති කාමරයක් තුළ සිටින සිසුන් පිරිසකගේ සමූහ ඡායාරූපයක් ගැනීමට වඩාත් සුදුසු කාච වර්ගය,

(1) සාමාන්‍ය කාචය (2) දුර රූප කාචය

(3) යුහුඹු කාචය (4) පුළුල් කෝණ කාචය

33. තොරතුරු රැස්කිරීමේ ශිල්පීය ක්‍රමයක් නොවන්නේ,

(1) සම්මුඛ සාකච්ඡා (2) ප්‍රශ්නාවලී

(3) විචක්ෂණබව (4) බුද්ධි කලම්බනය

34. රජය විසින් තෙල් මිළ ඉහළ නැංවීමට තීරණය කරයි. මෙය,

(1) මෘදු පුවතකි (2) දෘඪ පුවතකි

(3) කාලීන පුවතකි (4) හොඳ පුවතකි

35. ස්වර්ණමය රීතිය අදාල වන්නේ,

(1) ගුවන්විදුලි මාධ්‍යයට (2) පුවත්පත් කර්මාන්තයට

(3) ඡායාරූප ශිල්පයට (4) පරිගණක මුද්‍රණයට

36. ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත පළමුවන පුවත්පත,

(1) ලංකාලෝකය (2) ලක්මිණි පහන

(3) කලම්බු ජර්නල් (4) දිනමිණ

37. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ (DTP) දක්නට නොමැති අංගයක් වන්නේ,

(1) අවම පිරිවැය (2) කාර්යක්ෂමතාව

(3) ඉක්මන් බව (4) වැඩි මිනිස් බලයක් අවශ්‍ය වීම

38. පුරවැසියෙකුගේ ලක්ෂණයක් නොවන්නේ,

(1) බදු නොගෙවීම (2) නීතිගරුක වීම

(3) සියලු ආගම් වලට ගරු කිරීම (4) යහපත්ව ජීවත් වීම

39. ''ඔෆ්සෙට් ලිතෝගැෆි'' මුද්‍රණයේදී යොදා ගන්නා මූලික වර්ණ හතර වනුයේ,

(1) සයන්, රතු, නිල්, කළු

(2) රතු, නිල්, කොළ, කළු

(3) කළු, කොළ, මැජෙන්ටා, නිල්

(4) සයන්, මැජෙන්ටා, කහ, කළු

40. A + B + C = විශ්වසනීයත්වය

(1) නිවැරදි බව + සමතුලිත බව + පැහැදිලි බව

(2) සමතුලිත බව + නිවැරදි බව + පැහැදිලි බව

(3) නිවැරදි බව + සමීප බව + සමතුලිත බව

(4) කැපී පෙනීම + අදාල බව + නිවැරදි බව

### පළමු වාර පරීක්ෂණය - 2019
### සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I
### 11 ශ්‍රේණිය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (11) | 4 | (21) | 1 | (31) | 1 |
| (2) | 2 | (12) | 1 | (22) | 2 | (32) | 4 |
| (3) | 4 | (13) | 1 | (23) | 4 | (33) | 3 |
| (4) | 4 | (14) | 2 | (24) | 3 | (34) | 2 |
| (5) | 4 | (15) | 2 | (25) | 4 | (35) | 3 |
| (6) | 3 | (16) | 3 | (26) | 2 | (36) | 3 |
| (7) | 2 | (17) | 3 | (27) | 1 | (37) | 4 |
| (8) | 4 | (18) | 3 | (28) | 3 | (38) | 1 |
| (9) | 3 | (19) | 1 | (29) | 1 | (39) | 4 |
| (10) | 1 | (20) | 4 | (30) | 4 | (40) | 1 |